# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1997 අංක 21 දරන කුඩා තේ වතු සංවර්ධන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1997 අගෝස්තු මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 අගෝස්තු මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 3.40 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

**1997 අංක 21 දරන කුඩා තේ වතු සංවර්ධන (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1997 අගෝස්තු මස 12 වන දින]

එල්.ඩී.–ඕ. 49/96.

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1997 අංක 21 දරන කුඩා තේ වතු සංවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — *ලුහුඬු නාමය.*

2. (මෙහි මින් මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනතේ 14 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — *ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන පනතේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(අ) එම වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (ඇඇ) කුඩා තේ වතු සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම හා පාලනය කිරීමට සහ අධිකාරිය වෙත ලියාපදිංචි කර ඇති එවැනි සමිතිවල සාමාජිකයන්ට ආධාර ලබාදීම"; සහ

(ආ) එහි (ඇ) ඡේදයෙහි "එම ඉඩම්වල පළදාව" යන වචන වෙනුවට "එම ඉඩම්වල පළදාව නිෂ්පාදන බවට පත් කිරීමෙහි හෝ ඒවා ඇසුරුම් කිරීමෙහි යෙදී සිටින්නන්ට ව්‍යවස්ථාපිත හිමිකම් සහ පාරිශ්‍රමික ගෙවීම ද ඇතුළුව එම ඉඩම්වල පළදාව" යන වචන ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඔ) ඡේදයේ " අවලංගු කිරීමේ නියමයන්ට විරුද්ධව අභියාචන ඉදිරිපත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වෙන රීති සෑදීමට " යන වචන වෙනුවට " අවලංගු කිරීමේ නියමයන්ට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම, ලියාපදිංචි කිරීම අවලංගු කිරීමෙන් පසු ගණන් බේරා වසාදැමීම, ඇවරකරුවකුගේ බලතල හා ඇවරකරුවකු විසින් කරන ලද නියමයන් ක්‍රියාත්මක කිරීම සඳහා විධිවිධාන සැලැස්වෙන රීති සෑදීමට " යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — *ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.*

2—D 043293—5,900 (97/04)

ප්‍රධාන ප්‍රඥප්තියට 17 අ වගන්තිය ඇතුළත් කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය, එම ප්‍රඥප්තියේ 17අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

සමිති ලියාපදිංචි කළ යුතු බව.

17අ (1) පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීම සඳහා සමිතියක් විසින්, රීති මගින් නියම කර ඇති ආකාරයට තත්කාර්ය සඳහා නියමිත ගාස්තුව ද සමග අධිකාරිය වෙත ඉල්ලුම් කළ හැකි ය.

(2) (මෙහි මින් මතු "ලියාපදිංචි සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද සමිතියක්, (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද නාමයෙන් සංස්ථාවක් විය යුතු ය. තවද, ඊට අවිච්ඡින්න පැවැත්මක් ඇති අතර, එකී නාමයෙන් එය විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

(3) සෑම ලියාපදිංචි සමිතියකට ම පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, එය සමිතිය විසින් තීරණය කරනු ලබන තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ සමිතියක් ලියාපදිංචි කරනු ලබන අවස්ථාවක දී ලියාපදිංචි කිරීමේ ලේඛනයෙහි සඳහන් කර ඇති නාමයෙන් ඒ සමිතිය ලියාපදිංචි කර ඇති බව ද, ලියාපදිංචි කර ඇත්තේ කවර දිනක සිට බලපවත්වන පරිදි ද යන බව ද දැක්වෙන නිවේදනයක් අධිකාරිය විසින් ගැසට් පත්‍රයේ පළකරවීමට සැලැස්විය යුතු ය. තවද ලියාපදිංචි කරන ලද සමිතියක ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ විට, ඒ සමිතියේ ලියාපදිංචිය අවලංගු කර ඇති බව දැක්වෙන නිවේදනයක් අධිකාරිය විසින් ගැසට් පත්‍රයේ පළ කරවීමට සැලැස්විය යුතු ය.'.

අනනුකූලතාවක් ඇතිවුවහොත්, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.